# ලෝභයෙන් ද්වේෂයෙන් මෝහයෙන් කළ කර්ම දුගතිය පිණිස පවතියි සුගතිය පිණිස නොපවතියි

## කම්මනිධාන සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 4 - පිටු අංක 96 - 99)

කර්ම රැස්වීම පිණිස හේතු වූ කරුණු තුනකි.

කවර තුනක් ද යත්;

1. ලෝභය
2. ද්වේෂය
3. මෝහය වෙයි.

- ලෝභයෙන් අලෝභය නූපදියි. නමුත් ලෝභයෙන් ලෝභය ම උපදියි.
- ද්වේෂයෙන් අද්වේෂය නූපදියි. නමුත් ද්වේෂයෙන් ද්වේෂය ම උපදියි.
- මෝහයෙන් අමෝහය නූපදියි. නමුත් මෝහයෙන් මෝහය ම උපදියි.

ලෝභයෙන් හට ගත් කර්මයෙන්, ද්වේෂයෙන් හටගත් කර්මයෙන්, මෝහයෙන් හටගත් කර්මයෙන් දෙවියන් වී නූපදියි. මනුෂ්‍යයන් වී නූපදියි. යම් බඳු අනෙකුත් සුගතිවල ද නූපදියි.

ලෝභයෙන් හටගත් කර්මයෙන්, ද්වේෂයෙන් හටගත් කර්මයෙන්, මෝහයෙන් හටගත් කර්මයෙන් නිරයෙහි උපදියි. තිරිසන්ලොව උපදියි. ප්‍රේතලොව උපදියි. තවත් දුගති ඇත්නම් ඒවායේ ද උපදියි.

කර්ම රැස්වීම පිණිස හේතු වූ කරුණු තුනකි.

කවර කරුණු තුනක් ද යත්;

1. අලෝභය
2. අද්වේෂය
3. අමෝහය වෙයි.

- අලෝභයෙන් ලෝභය නූපදියි. අලෝභයෙන් අලෝභය ම උපදියි.
- අද්වේෂයෙන් ද්වේෂය නූපදියි. අද්වේෂයෙන් අද්වේෂය ම උපදියි.
- අමෝහයෙන් මෝහය නූපදියි. අමෝහයෙන් අමෝහය ම උපදියි.

අලෝභයෙන් හටගත් කර්මයෙන්, අද්වේෂයෙන් හටගත් කර්මයෙන්, අමෝහයෙන් හටගත් කර්මයෙන් දෙවියන් වී උපදියි. මනුෂ්‍යයන් වී උපදියි. යම් බඳු අනෙකුත් සුගතිවල ද උපදියි.

අලෝභයෙන් හටගත් කර්මයෙන්, අද්වේෂයෙන් හටගත් කර්මයෙන්, අමෝහයෙන් හටගත් කර්මයෙන් නිරයේ නූපදියි. තිරිසන් ලොව නූපදියි. ප්‍රේත ලොව නූපදියි. යම් බඳු අනෙකුත් දුගතිවල ද නූපදියි.